# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (ඔක්තෝබර්-3 සතිය)

## 13 තේමාව - පොළොව හා අහස

දූවේ පුතේ, මේ සතියේ ඔබ නිවසේ වැඩිහිටියෙක් සමඟ හොඳ වැඩකට සූදානම් වෙන්න.

1. නිවසට ජලය ගන්න ජල කරාම අසල පොළව, ජල කරාමය, ජල බේසම අපිරිසිදු වෙලාද බලන්න. එය පිරිසිදු කරන්න.
2. වැසිකිළිය හා අවට පරිසරය අපිරිසිදු වෙලාද බලන්න. එය පිරිසිදු කරන්න.

   (වැසිකිළි වළ උඩට යන්න එපා. නිතරම නිවසේ වැඩිහිටියෙකුගේ උදවු ලබා ගන්න.)
3. නිවසේ කසළ ඉවත් කරන ස්ථානය තැන තැන පොලිතින්, බිස්කට් කවර එහෙම දමා තියෙනවද බලන්න.

- නිවසේ පරිසරය ලස්සන වෙන්න අපද්‍රව්‍ය වර්ග කරලා බැහැර කරමු නේද?
  - දිරන ද්‍රව්‍ය දමන්න වෙන ම බඳුනක් සහ
  - නොදිරන ද්‍රව්‍ය දැමීමට වෙන ම බඳුනක් සකස් කරගමු නේද?

- වත්තේ ගස්වල වැටෙන කොළ රොඩු එකතු කරලා කොම්පෝස්ට් බඳුනක් සකස් කර ගනිමු නේද?



- දූවේ පුතේ වැඩිහිටියෙක් උදවු කරගෙන පහත දක්වෙන සේ කොම්පෝස්ට් බඳුනක් සකස් කරගන්න. වත්තෙන් ම හොයාගත් ලී කෝටු, පොල්පිතිවලින් මෙය සකස් කරගන්න පුළුවන්.

දිනපතාම මිදුල අතුගාන රොඩු මෙයට දමන්න. ගෙදර අයටත් කියන්න.

ගැලපෙන වැකි යා කරන්න.

| | | |
|---|---|---|
| 1. | පොලිතින් තැන තැන දැමීමෙන් | පිරිසිදුව තිබිය යුතුයි. |
| 2. | අපද්‍රව්‍ය | පරිසරය දූෂණය වේ. |
| 3. | වැසිකිළි අවට පරිසරය. | කොම්පෝස්ට් හදාගන්න පුළුවන්. |
| 4. | දිරණ අපද්‍රව්‍ය වලින්. | වර්ග කර බැහැර කරමු. |